28 DEC 1995

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 17 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 සැප්තැම්බර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 සැප්තැම්බර් මස 07 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 2.00 යි.

## 1995 අංක 17 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 සැප්තැම්බර් මස 4 වන දින.]

එල්. ඩී.—ඕ. 48/94

### 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 17 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ 37 වන වගන්තියේ "භාණ්ඩය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත සඳහන් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 1979 අංක 1 දරන පනතේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

'"භාණ්ඩය" යන්නෙන්—

(අ) ආහාර හෝ පාන වන යම් භාණ්ඩයක් ;

(ආ) කොමසාරිස්වරයාගේ මතය අනුව ප්‍රජාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය වන්නා වූ ද, ඒ බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, වෙනත් යම් වෙළෙඳ භාණ්ඩයක් ;

අදහස් වේ ;'

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අසංගතතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස් වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.